# 22. මර්සලින් ජයකොඩි පියතුමා



මර්සලින් ජයකොඩි පියතුමා උපන්නේ දන්කොටුව, ගොඩැල්ල නැමති ගමේ. ඉගෙන ගත්තේ ගමේ පාසලේ මයි. මෙතුමා තමාගේ ගමට දැක් වූයේ පුදුම ආදරයක්.

ජයකොඩි පියතුමාට සිංහල සහ දෙමළ භාෂා හොඳට පුළුවන්. එතුමා ලියු ගීතිකා, කවි, සින්දු ආදිය හරි ම ප්‍රසිද්ධයි. පල්ලියේ ගායනා කරන ගීතිකා රාශියක් සහ වෙසක් බැති ගී බොහෝමයක් එතුමා ලියා තිබෙනවා. මේ නිසා බෞද්ධ අයත් එතුමාට ආදරෙයි. සැම දෙනා හා සමඟියෙන් සාමයෙන් ජීවත් වීමට එතුමාට හැකි වුණා.

ජයකොඩි පියතුමා අප වෙනුවෙන් ලියූ පහත සඳහන් ගීත හරි ම ලස්සනයි.

1. **රෝනට වඩින බිඟු ඔබයි**

(i) රෝනට වඩින බිඟු ඔබයි
කැකුළු මල මමයි
මලට සුවඳ ටික ඔබයි
සිහිනි පෙති මමයි

(ii) පහන් දෙරට හිරු ඔබයි
කුමුදුනිය මමයි
රැයට දිලෙන හඳ ඔබයි
හඳට රැය මමයි

**පේසු දෙවියනි - පේසු දෙවියනි**

2. **ඔබයි අපේ රාණී**

ඔබයි අපේ රාණී
ලස්සන ලක් රාණී
පොලොන්නරුව අනුරාපුර සීගිරි
සෙංකඩගල රාණී //

3. **ඕලු නෙලුම් නෙරිය රහාලා**

ඕලු නෙලුම් නෙරිය රහාලා
කිකිණි හඬන වලා නහාලා
ගහුල් තොටිල්ලේ මල් ඇතිරිල්ලේ
මගේ කුඩා ඔරුව හබල් ගා

යමු නැළවිල්ලේ නැළවිල්ලේ නැළවිල්ලේ
ඇදී ඇදී යන්න නදී රිදී තොටිල්ලේ //

**පැවරුම්**

1. මෙම පාඩමේ සඳහන් ගීත ගායනා කරන්න.
2. මෙම ගීතිකා හා සින්දුවල ඉතිරි කොටස් සොයා ගායනා කිරීමට පුරුදුවන්න.
3. මර්සලින් ජයකොඩි පියතුමා තුළ පැවති ගුණ කිහිපයක් ලියන්න.